# තෙවැනි ධර්මසංගායනාව සහ ධර්මදූත මෙහෙවර (පුරාවිද්‍යාත්මක සාධක හා ඓතිහාසික මූලාශ්‍ර ඇසුරෙන්)

**කුඩාවැවේ සෝමානන්ද හිමි**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.

**Abstract**

The purpose of this research is to show the ancient history of Sri Lanka and relationships with India in 3rd century B.C. depicted in primary litereary and archaeological sources. Aṭṭhakatha refers to Pali-language Theravada Buddhist commentaries to the canonical Theravada Tipitaka. They provide information on the history of Sri Lanka from about the 6th century BCE. And, the Pali chronicles as well as a large collection of stone inscriptions, the Indian epigraphical records etc. gives facts on the history of Sri Lanka. This research will explore the facts of utilizing those historical sources for the research and interpretation of the history of Sri Lanka.

***Key Words**: The Ancient History of Sri Lanka, Third Council, Arahath Mahinda*

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ බුද්ධ ශාසනය පිහිටුවීම මේ රටේ ඉතිහාසයෙහි සුවිශේෂී සංධිස්ථානයක් යැයි කිව හැකිය. ක්‍රිස්තු පූර්ව තෙවැනි සියවසේදී ඉන්දියාවේ සිට ශ්‍රී ලංකාවට පැමිණි මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රමුඛ ධර්මදූත කණ්ඩායමේ මෙහෙය වීම මත බුදුදහම ඉතාම කෙටිකාලයකින් මෙරට ව්‍යාප්ත වී ස්ථාපිත වූ අයුරු මූලාශ්‍රයන්හි සවිස්තරාත්මකව දැක්වෙයි. එම මූලාශ්‍රයන්හි දැක්වෙන්නේ තත් අවධියෙහි මෙරට පැවැති ආගමික පරිසරය, අනුරාධපුර පාලකයා ඇතුළු රාජකීය පවුලේ සාමාජිකයන් බුදුදහම වැළඳ ගැනීම, මිහිඳු හිමියන්ගේ කාර්යභාරය, මෙරට එවක ඉදිවූ ප්‍රධාන ආගමික ගොඩනැගිලි, විශේෂයෙන් සංඝමිත්තා රහත් මෙහෙණින් වහන්සේ ඇතුළු ශිල්ප ශ්‍රේණීන්ගේ පැමිණීම සහ මහමෙවුනා උයනෙහි ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ශාඛාව රෝපණය කිරීම, මෙහෙණි සසුන පිහිටුවීම යනාදියයි. එවැනි තොරතුරු අන්තර්ගත

ඓතිහාසික මූලාශ්‍රයන්හි විශ්වසනීයභාවය සනාථ කර ගැනීම මඟින් එම ඉතිහාසය තවදුරටත් පරීක්ෂා කොට සනාථ කර ගැනීම ඉතාම වැදගත්ය.

**සාකච්ඡාව**

පළමු හා දෙවැනි ධර්ම සංගායනා, තෙවැනි ධර්ම සංගායනාව මෙන්ම ඉන්පසුව ක්‍රියාවට නැගුණු ධර්මදූත ව්‍යාපාරය, ක්‍රි. පූ. හයවැනි සියවසේ සිට ක්‍රි. පූ. තෙවැනි සියවස දක්වා පැවැති උතුරු ඉන්දියාවේ රාජපරම්පරා ආදිය සම්බන්ධිත ශ්‍රී ලංකාවේ වංශකථාවල ඇතුළත් ඓතිහාසික තොරතුරු සම්ප්‍රදාය කෙරෙහි විශ්වාසය පලකිරීමට වින්සන්ට් ස්මිත්, ඔටෝ ප්‍රැන්ක් වැනි බටහිර විද්වතුන් මැළි වූහ. වින්සන්ට් ස්මිත් අසෝක අධිරාජයා, මිහිඳු මහරහතන් වහන්සේ සහ සංඝමිත්තා මහරහත් මෙහෙණින් වහන්සේ සම්බන්ධයෙන් ලංකා වංසකථාවල දක්නට ලැබෙන වෘත්තාන්ත මනස්ගාත යැයි තවදුරටත් පැවසීය. මෙවැනි අන්තගාමී අදහසින් බැහැරව මධ්‍යස්ථ ස්ථාවරත්වයක සිට විල්හෙල්ම් ගයිගර් පෙන්වා දුන්නේ ලංකා වංසකථාවල සඳහන් ථෙරවාදි ඓතිහාසික සම්ප්‍රදාය විශ්වසනීය පදනමක පිහිටා ඇති බවය (Mahavamsa (Mv.), 1934: pp. ix-xx). දීපවංසය, සමන්තපාසාදිකා බාහිර නිදාන වණ්ණනා මෙන්ම මහාවංසය යන ග්‍රන්ථයන් තුලනාත්මකව පරීක්ෂණයට බඳුන් කරමින් ඔහු ඒවායේ දැක්වෙන ඓතිහාසික සම්ප්‍රදායේ ප්‍රභවය සහ විකාශනය පෙන්වා දීමට සමත් විය. මහාවංසය හා චූලවංසය මැනවින් සංස්කරණය කොට එම ග්‍රන්ථයන්හි ඓතිහාසික පදනම සනාථ කෙරෙන දීර්ඝ ප්‍රස්ථාවනාවක් ද සහිතව පල කෙරිණි (Culavamsa (Cv.) Vol. I: 1934; Mv. 1934). ඉහත සඳහන් කළ බෞද්ධ ධර්මදූත ව්‍යාපාරය සහ ඊට පසුබිම් වූ තුන්වැනි ධර්ම සංගායනාව පුරාවිද්‍යාත්මක සාධක මගින් සනාථ වීම ශ්‍රී ලංකාවේ බුදු සසුන පිහිටුවීම සම්බන්ධිත ඉතිහාසය සත්‍ය යැයි පිළිගැනීමට සිදුවෙයි. සාහිත්‍ය මූලාශ්‍රවලට අනුව බුදුන් වහන්සේගේ පරිනිර්වාණයෙන් අනතුරුව තෙමසක් සහ සියවසක් ගිය පසු පැවැත් වූ පළමු සහ දෙවැනි සංගායනා තුලින් ශාසනයේ චිරපැවැත්ම උදෙසා ක්‍රියාකළ වූවක් බව සනාථ වේ (දීප, 1970: පරි. 9, ගාථාග 21ල 22ල 30 - 31ල 38; ථූපවංශ, 1959: පරි. 6, ගාථා. 47, 71, 74; සමන්ත, 1900: 13-17.). ඉන්පසු තෙවැනි සංගායනාව බුද්ධ පරිනිර්වාණයෙන් වසර දෙසිය දහඅටක් ගිය පසු ධර්මයේ මෙන්ම ශාසනයේ චිරපැවැත්ම සඳහා ගන්නා ලද කාලෝචිත ක්‍රියාමාර්ගයකි. එහි ප්‍රතිඵලයක් වශයෙන් බුදුදහම ඉන්දියාවේ ප්‍රත්‍යන්ත ප්‍රදේශ සඳහාත් ඉන්දියාවෙන් පරිබාහිර ප්‍රදේශ වන ලක්දිව, ස්වර්ණභූමිය හා යවන ලෝකය වැනි ප්‍රදේශවලටත් මොග්ගලීපුත්තතිස්ස හිමියන් සහ මෞර්ය පාලක අශෝකයන් ගත් ක්‍රියාමාර්ග මගින් ඉටුවිය (දීප, 1970: පරි. 8; ථූපවංශ, 1959: පරි. 12; සමන්ත, 1900: 25-27.). තෙවැනි ධර්මසංගායනාව සහ ධර්මදූත ව්‍යාපාරය පිළිබඳ ශ්‍රී ලාංකේය පාලි මූලාශ්‍ර ග්‍රන්ථ වන දීපවංසය, මහාවංසය සහ සමන්තපාසාදිකාව යන වංසකථා හා අට්ඨකථාවේ පූර්ණ විස්තරයක් දැකිය හැකිය (දීප, 1970: පරි. 6-7; ථූපවංශ, 1959: පරි. 5-2; සමන්ත, 1900: 26-29). එහෙත් දිව්‍යාවදාන වැනි ඉන්දීය සාහිත්‍ය මූලාශ්‍රයන්හි තොරතුරු ඇතුළත් වන්නේ සීමිතවයි. මෞර්ය අධිරාජ්‍යය අශෝකයන් සිය දික්විජය ප්‍රතිපත්තිය යටතේ ස්වකීය ආධිපත්‍යය ඉන්දියාවේ විශාල භූමි ප්‍රදේශයක ව්‍යාප්ත කළ අතර ඔහුගේ කාලිංග යුද්ධයෙන් අනතුරුව ධර්මවිජයේ ඇති වටිනාකම කොතරම් ද යන්න පිළිබඳව ඔහුගේ අංක දහතුන (XIII) දරණ සෙල්ලිපියේ පෙන්වා දෙයි (Corpus Inscriptionum Indicarum (CII), 1991: 45). සසුන තුළ මිසදිටු අදහස් ව්‍යාප්ත කිරීමට දැරූ ප්‍රයත්නයන් වළකාලීම සඳහා තෙවැනි සංගායනාව කිරීම සඳහා අශෝකයන් අනුග්‍රහය දැක්වූ බව වංසත්ථප්පකාසිනී ආදී මූලාශ්‍ර

දැක්වෙයි (දීප, 1970: පරි. 7, ගාථා. 34-38; ඌපුම, 1959: පරි. 5 ගා. 228 -229; සමන්ත, 1900: 4; Vamsatthappakasini , 1935: 288). තෙවැනි සංගායනාව සම්බන්ධයෙන් ශ්‍රී ලාංකේය වංසකථා මූලාශ්‍රයන්හි දැක්වෙන තොරතුරුවල විශ්වසනීයභාවය තහවුරු කිරීමෙහි දී පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන්හි සහය ලබාගැනීම ඉතාමත් වැදගත්ය. අශෝක හා අශෝකයන්ගේ අභිලේඛන පිළිබඳව අධ්‍යයන කළ ඇතැම් උගත්හු ඔහු බෞද්ධයකු නොවන බවත් (Heras, 1927: 255 - 276) ඇතැම්හු ඔහු බෞද්ධයකු බවත් පෙන්වාදීමට උත්සහා දරා තිබේ (Wilson, 1848: 234-256; ධීරානන්ද හිමි, 2005: 37). අශෝකයන්ගේ අභිලේඛන වයඹදිග ඉන්දියාවේ කන්දහාර් ප්‍රදේශයේ සිට නැගෙනහිරින් ඔරිස්සාවේ ධෞලි හා ජෞගඩපූර් දක්වාත්, කල්සි, ලුම්බිණි වැනි හිමාල පාමුල ප්‍රදේශයේ සිට දකුණේ මස්කී, බ්‍රහ්මගිරි වැනි ප්‍රදේශ තෙක් ද පිහිටුවා ඇත. එහෙත් තෙවැනි සංගායනාව ගැන කිසිදු සඳහනක් එම අභිලේඛනවල නොමැති හෙයින් ඇතැමෙක් මේ පිළිබඳව සැක පහළ කරති. එනමුදු අභිලේඛනවල අන්තර්ගත තොරතුරු තුළින් තෙවැනි සංගායනාව සම්බන්ධව යම් යම් සාධක අනාවරණය කර ගැනීමට හැකි බව ධීරානන්ද හිමියෝ පවසති (ධීරානන්ද හිමි, 2005: 37-41).

තෙවැනි ධර්ම සංගායනාවේ ප්‍රතිඵල අතරින් ප්‍රධාන කාර්යය වන්නේ ඉන්දියාවේ ප්‍රත්‍යන්ත ප්‍රදේශයන්හි ද ඉන්දියාවෙන් බැහැර ප්‍රදේශයන්හි ද බුදුදහම ව්‍යාප්ත වීමය. ඒ පිළිබඳ දක්නට ලැබෙන පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර අධ්‍යයනය කිරීම තුළින් තෙවැනි සංගායනාව පිළිබඳව තවදුරටත් තොරතුරු සනාථ කරගත හැකිය. මෙම ධර්මදූත ව්‍යාපාරය සම්බන්ධයෙන් වංශකථා සහ විනය අටුවාවේ සවිස්තරාත්මක තොරතුරු ඇතුළත් බව පැහැදිලිය. (දීප,1970: පරි. 8, 4 - 12 ගාථා; ඌපුම, 1959: පරි. 12, 1-10 ගාථා; සමන්ත, 1900: 29). ඒ අනුව මොග්ගලීපුත්ත තිස්ස හිමියන්ගේ ඓතිහාසිකත්වය සාංචියේ එක් ධාතු මඤ්ජුසාවක පත්ලෙහි ''සපුරිස මොගලිපුතස'' යනුවෙන් සඳහන් පාඨය තුළින් සනාථ කරගත හැකිය (Cunningham, 1966: 190). සාහිත්‍ය මූලාශ්‍රයන්හි එන මෙම ධර්මදූත ව්‍යාපාරය පිළිබඳ සාධක පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර තුළින් තහවුරු කරගැනීමට සාධක ලැබෙන්නේ නම් තෙවැනි සංගායනාවේ ඓතිහාසිකත්වය තවදුරටත් සනාථ වේ. තවද වංසකථාවලත් සමන්තපාසාදිකාවේත් ධර්මදූත කණ්ඩායම් නවයක් නායකත්වය දැරූ භික්ෂුවකගේ ප්‍රධානත්වයෙන් විවිධ ප්‍රදේශවලට යැවූ බවත් ශ්‍රී ලංකාවට මහින්ද තෙරුන් ප්‍රමුඛ භික්ෂූන් පස්නමක් යැවූ බවත් සඳහන් වේ (දීප, 1970: පරි. 8, 4-12 ගාථා; ඌපුම, 1959: පරි. 12, 3 - 10 ගාථා; සමන්ත, 1900: 29). සාහිත්‍යගත මූලාශ්‍රයන්හි දැක්වෙන ධර්මදූත ක්‍රියාවලියට සම්බන්ධ අරහන්ත කස්සපගොත්ත ආදී තෙරවරුන්ගේ නාමයන් අභිලේඛන තුළින් සනාථ වී තිබීමෙන් ඔවුනගේ ඓතිහාසිකත්වයත් තෙවැනි සංගායනාවේ නිරවද්‍ය බවත් තහවුරු වේ (Cunningham, 1966: 189). ඉන්දියාවේ මධ්‍ය ප්‍රදේශයට අයත් සාංචියේ දෙවන ස්තූපයේත් සෝනාරි සහ ආන්ද්‍රේ ස්තූපයන්හිත් කළ කැණීම් තුළින් හමු වූ ධාතු මඤ්ජුසාවල තිබෙන ලේඛනත් (Cunningham,1966: 189, 191, 203 - 225, 31 – 33) මෙරට රජගලින් සහ මිහින්තලයෙන් ලැබුණු අභිලේඛන සාධකත් සංසන්දනය කොට අධ්‍යයනය කිරීමෙන් පුරාවිද්‍යාත්මකව මෙම ධර්මදූත ව්‍යාපාරයට නායකත්වය දුන් මහින්ද හිමියන් ප්‍රමුඛ කණ්ඩායම මෙරට පැමිණි බව තහවුරු කරගැනීමට හැකි වේ. සාංචිය අවට ප්‍රදේශය මෞර්යයන්ගේ බෞද්ධාගමික කාර්යභාරයේ සුවිශේෂ ප්‍රදේශයක් ලෙස සර් ජෝන් මාෂල්, ඇලෙක්සැන්ඩර් කනිංහැම් වැනි පර්යේෂකයන් පුරාවිද්‍යාත්මකව සාක්ෂි සොයාගැනීමෙන් සනාථ වේ (Cunningham, 1966: 145-148; Marshall, and Fourche, 1983: 80-85; ධීරානන්ද හිමි, 2005: 53-55).

සාංචිය බෞද්ධ සිද්ධස්ථානයක් වශයෙන් බොහෝ කාලයක් වර්ධනය වූ ස්ථානයකි. මුල්කල එය මිහිඳු හිමියන්ගේත් එම ඥාතින්ගේත් අනුග්‍රහයට ලක් වූ ස්ථානයක් වන අතර අශෝකයන්ගේ ධර්මදූත ව්‍යාපාරය සම්බන්ධ පැහැදිලි පුරාවිද්‍යාත්මක සාක්ෂි හමුවන ස්ථානයක් ද වෙයි (ථූපවංශ, 1959: පරි. 12, 9-28 ගාථා ; සමන්ත,1900: 29).

අශෝක අධිරාජයාගේ ප්‍රමුඛත්වයෙන් බුදුදහම හඳුන්වාදීම සංස්කෘතිකමය පාර්ශ්වයෙහි සුවිශේෂත්වය සනිටුහන් කරනු ලබන්නකි (දීප, 1970: පරි. 12; ථූපවංශ, 1959: පරි. 11, 29 - 39 ගාථා; සමන්ත,1900: 18). මෞර්ය ශ්‍රී ලංකා සබඳතාවය පාලන සංවිධානයේ සහ පාලන නායකත්වයෙහි හැඩගැසීම උදෙසා ඍජුවම බලපෑවේය. අශෝක අධිරාජයා ඉන්දීය ප්‍රදේශයන් මෙන්ම ඉන් පරිබාහිර වෙනත් රාජ්‍යය පාලකයන් සමඟ සබඳතාවයන් ගොඩනගාගත් අයුරු ඔහුගේ අභිලේඛනයන් මඟින් පෙනීයයි (Corpus Inscripationum Indicarum, 1925: 7,15). ඒ අනුව ස්වකීය මිත්‍රයෙකු වූ එවක මෙරට පාලක දේවානම්පිය තිස්ස රජු සමඟ ඔහු විසින් සබඳතාවයන් ගොඩනගාගනු ලැබීය. (UCHC, 196: 135). අශෝක ලිපිවල සහ වෙනත් දේශීය සාහිත්‍යය මූලාශ්‍රවල තිබෙන තම්බපණ්ණි යන්න ශ්‍රී ලංකාවම බව පැහැදිලිය (Rahula, 1993:10). අශෝකයන්ගේ දහතුන් වැනි ගිරි ලිපියෙන් පෙනෙන්නේ තම ධර්මමහාමාත්‍රවරු උපයෝගි කොටගෙන ශ්‍රී ලංකාවේ අශෝක ධර්මය සම්බන්ධයෙන් සාධනීය පරිසරයක් මහින්දාගමනයට පෙර සිටම සකස්කරනු ලැබූ බවය (දීප, 1970: පරි. 08, 2, 12; ථූපවංශ, 1959: පරි. 11, 19, 131 ගාථා; පරි. 12, 3-7, පරි. 17, 11-12 ගාථා). තෙවැනි ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් වශයෙන් විවිධ ප්‍රදේශයන් කරා ධර්මදූත ව්‍යාපාරය ව්‍යාප්ත කරනු ලැබූ බව ඉහත සඳහන් කළේය. (දීප, 1970 : පරි. 12, 20-.21 ගාථා; ථූපවංශ, 1959: පරි. 12, 20, 26, 84 ගාථා). ඒ අනුව ශ්‍රී ලංකාව, ස්වර්ණභූමිය, යවනලෝකය ආදී ප්‍රදේශ කරා බුදුදහම ව්‍යාප්තියටත් චිර පැවැත්ම උදෙසාත් වැදගත් පියවර ගන්නා ලදි (දීප, 1970: පරි. 8, ථූපවංශ, 1959: පරි. 12, සමන්ත, 1900: 25 - 29). කාලිංග යුද්ධයෙන් අනතුරුව යුද්ධයෙහි පවතිනු ලබන අතිශය භයංකාරභාවයත් නිරර්ථකභාවය වැටහී ගිය හෙයින් ධර්ම විජය ප්‍රතිපත්තියෙහි වටිනාකම අශෝකයන් විසින් ස්වකීය අංක දහතුන දරණ ලිපියෙහි දක්වා ඇත (Thapar, 1961: 135). එකී සාධකයනට අනුව අභිලේඛනයන්හි අන්තර්ගත තොරතුරු පරීක්ෂණයට ලක්කිරීමෙන් පෙනීයනු ලබන්නේ එම සබඳතාවන්හි දේශපාලන පරමාර්ථයන් ද ගැබ් වී ඇති බවය. එනමුදු ශ්‍රී ලාංකේය සාහිත්‍යය මූලාශ්‍රයන්හි අශෝක තිස්ස සබඳතාවය ආගමික පාර්ශ්වයට වැඩි අවධානයක් යොමුකොට දක්වා තිබෙන බව පෙනීයයි.

මෞර්ය පාලක චන්ද්‍රගුප්ත යටතේ ඇෆ්ගනිස්ථානයේ සිට මයිසූර් තෙක් ව්‍යාප්තව තිබුණු විශාල අධිරාජ්‍යයක් සංවිධානය (Mookerji,1928:12) වී තිබුණු අතර බින්දුසාර නම් ඔහුගේ පුත්‍රයා තම පියාගෙන් ලැබුණු අධිරාජ්‍යය රැකගත්තා වියහැකි අතර ඇතැම් විට තවදුරටත් ව්‍යාප්ත කරන්නට ද ඇත. ඒ අනුව අශෝකයන් ද එම ක්‍රියාමාර්ගයම ක්‍රියාවට නන්වන්නට ඇත. දෙවනපිය (CII, Vol. I, pp.1, 2, 27, 50, 150-158,160-172) යන අශෝකයන් විසින් දැරූ විරුදය මෙරට මුල් පාලකයන් ද භාවිත කළ අතර සාහිත්‍යය මූලාශ්‍රයන්හි (දීප, 1970: පරි. 12. 38 ගාථාව, ථූපවංශ, 1959: පරි. 13, 13 ගාථාව; සමන්ත, 1900: 25, 29) එම විරුදය පළමුවෙන්ම තිස්ස රජු විසින් දැරූ බව සඳහන් වේ. ''උතිමහරකඩ'' නමින් සඳහන් වෙන දෙවනපෑතිස්ගේ සහෝදර උත්තියත් එම විරුදය දැරූ බව අභිලේඛනයක් මඟින් පෙනීයයි (IC, Vol. I, Nos. 46 - 47, 4). ඒ හැර වෙනත් පාලකයන් රැසක් ද මේ විරුදය දරා තිබේ. අනුරාධපුර පාලක දෙවනපෑතිස් රජු විසින්

''දෙවනපිය'' යන විරුදය භාවිත කළේ කුමන කාරණයක් පදනම් කරගෙන ද යන්න පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත්ය. ඒ අනුව දෙවනපෑතිස් මෞර්ය පාලකයා සමඟ සබඳතාවයක් ගොඩනගා ගැනීමෙන් තමාට තත්කාලීන දේශපාලන තත්ත්වය සුභදායි කරගැනීමටත් එහිදි තම පක්ෂපාතිත්වය දක්වා තම පාලන ඒකකය හා තම නායකත්වය වඩාත් ශක්තිමත් කරගැනීමටත් ඔහු මෞර්ය පාලකයා සමඟ සබඳතාවයක් ගොඩනගා ගන්නට උත්සාහ කරන්න ඇතැයි සිතීමට හැකිය. එය පෙරදිග ලෝකයේ සිටි ප්‍රබල අධිරාජයෙකු සමඟ සබඳතාවයත් ඔහුගේ විරුදය භාවිත කරමින් ද තම පාලන ඒකකය දේශපාලනිකව ඉදිරියට ගෙන ඒ මෙහිලා කළ එක් උපක්‍රමයකි (ධීරානන්ද හිමි, 2004: 262). මෙරටට මෞර්ය සම්ප්‍රදායේ (Vamsatthappakasani, 1935:303) ආභාසය රාජ්‍යය පාලනය සඳහා ක්‍රි. පූ. 3 වැනි සියවසේ එනම් දෙවනපෑතිස් කළ සිටම තිබූ හෙයින් ''දෙවනපිය'' විරුදය එයට ගරු කිරීමක් (ධීරානන්ද හිමි, 2004: 266) ලෙස භාවිත කරන්නට ඇත.

ශ්‍රී ලාංකේය සාහිත්‍යය මූලාශ්‍රවල එන දේවානම්පිය තිස්ස අශෝක වෙත යැව් දූත ගමන (දීප, 1970: පරි. 12, 1-12, 17, 27; ථූපූම, 1959: පරි. 12, 8 ගාථාව, පරි.13 15 ගාථාව; සමන්න, 1900:29) හුදෙක් මිත්‍රත්වය ප්‍රකාශ කිරීමක් ද නැතහොත් දේශපාලනමය අභිප්‍රායන් උදෙසා ද යන්න විද්වතුන් අතර සාකච්ඡාවට බඳුන්ව ඇත. ඒ අනුව එයින් අශෝකයන් දැරූ රාජකීය විරුදය සම්මාන සහිතව පවරා දෙන ලෙස ඉල්ලූ බව පරණවිතාන (Paranavitana, 1936: 443) සඳහන් කළත් එච්. ඩබ්. කොඩ්රිංග 'ටන් අශෝක තම රටේ දී ලබා සිටි තත්ත්වය මත ස්වකීය බලය තහවුරු කරගැනීමේ පරමාර්ථයෙන් යැව් දූත ගමනක් ලෙස දක්වයි (Codrington, 1947: 12). මේ ගැන අවධානයට ලක්කරන එන්. ඒ. පේක්මන් තත්කාලීනව අශෝකයන් විසින් ඉන්දියාවේ දකුණු ප්‍රදේශ තෙක් ස්වකීය අණසක ව්‍යාප්ත කර තිබූ හෙයින් තම පක්ෂපාතීත්වය දැක්වීම උදෙසා යැවූ දූත ගමනක් ලෙස පවසයි (Pakeman, 1964: 28). ඒ අනුව සාහිත්‍යය පාර්ශ්වය මෙන්ම විචාරක මත යන දෙයංශය මත මෙහි දේශපාලන පරමාර්ථයක් අන්තර්ගත බව හඟුරන්කෙත ධීරානන්ද හිමියෝ පවසති (ධීරානන්ද හිමි, 2004: 271). එය තවදුරටත් සනාථ වන්නේ දෙවනපෑතිස් විසින් නොයෙකුත් අගනා මුතු වර්ග සහ රුවන් වර්ග ආදිය අශෝකයන් වෙත යැවීමෙන් (සමන්න, 1900: 25 - 29) ද අශෝකයන් ද රාජකීය නියෝජිතයන් වූ අරිට්ඨ හට සෙනවිරත් තනතුර ද බ්‍රාහ්මණයා හට පුරෝහිත තනතුර ද ඇමතියා හට දණ්ඩනායක තනතුර ද සිටු තනතුර ගණකයා හටත් තම රාජ්‍යයෙහි දීම ලබාදීම (ථූපූම, 1959: පරි. 11, 20, 26 ගාථා; සමන්න, 1900: 25 - 29) සහ ඡත්‍රය, චාමරය, ඛඬ්ගය, මෞලිය, රුවන් මිරිවැඩි සඟලය යන අභිෂේකය පිණිස අවශ්‍ය අභිෂේක උපකරණ එවීමත් යන කරුණු පදනම් කරගෙනය (සමන්න, 1900: 25 - 29).

මෙම සබඳතා මත පරිපාලනමය තනතුරු ප්‍රදානයත් අභිෂේක උපකරණ එවීමත් මෙහිදී ගැටළු සහගත තත්ත්වයක් මතු කරයි. මිත්‍රත්වය ප්‍රකාශ කිරීම මත එය තහවුරු කිරීමට නියෝජිතයන් ගිය හෙයින්ය. දෙවනපෑතිස් අවධියේ රාජ්‍යාභිෂේකය සඳහන් කිරීමේ දී ඊට පෙර සිටි පාලකයන් ''නවයට්ඨී'' නම් සැරටියක් පමණක් තම රාජ්‍ය සංකේතය ලෙස භාවිත කළ අතර අභිෂේකයක් නොතිබූ දෙවනපෑතිස්ස ද ''නවයට්ඨීය'' උපයෝගී කරගෙන පාලන කටයුතු කරගෙන යන බව දූතයන් විසින් ප්‍රකාශ කළ බව වංසත්ථප්පකාසිනියේ සඳහන්ව තිබීමෙන් (Vamsatthappakasani, 1935: 306) යට කී ගැටළු සහගත තත්ත්වය මගහැරී යනු ඇත. ඒ අනුව දෙවනපෑතිස් යැවූ

දූත ගමනේ දේශපාලනික පරමාර්ථයන් තිබුණ ද මෞර්යයන් විසින් ප්‍රදානය කළ තනතුරු මෙරට පාලන තන්ත්‍රයට ඍජුවම භාවිත කළ බව (ධීරානන්ද හිමි, 2004: 241 - 272) කීමට අපහසුය.

ධර්ම මහාමාත්‍රවරු උපයෝගී කොටගෙන සංස්කෘතික හා දේශපාලන සබඳතාවන් අශෝකයන් තිස්ස සමඟ ගොඩනගාගත් පසු එම සබඳතාවයන් නැවත දූතයන් අශෝකයන් වෙත යැවීමෙන් තහවුරු කරගන්නට ඇත. ඒ අනුව ක්‍රි. පූ. 3 වැනි සියවසේදී මෙම සබඳතාවය පැහැදිලිවම සංස්කෘතික සබඳතාවයක් ගොඩනැගීමටත් පාලන සංවිධානයක පසුබිම සැකසීම කෙරෙහි මෙන්ම රාජ්‍යයේ වර්ධනය කෙරෙහි ද බලපාන ලදි (ධීරානන්ද හිමි, 2004:272).

බුදුදහමට සම්බන්ධිත පූජා වස්තූන් ආදිය ජනයාට හඳුන්වාදීම මෙන්ම ඒ හා සබැඳි ආගමික වතාවත්වලට යොමු කිරීම බෙහෙවින්ම වැදගත් වේ. ඒ අනුව මිහිඳු හිමියන් ඇතුළු පිරිස හා රජු මැදිහත්ව ඒ සඳහා කටයුතු සංවිධානය කර මේ රටට එම පූජා වස්තූන්, වතාවත් හඳුන්වා දෙනු ලැබීය. මිහිඳු හිමියන් අශෝක වෙත සුමන සාමණේරයන් යවා පාත්‍රය පුරවා ධාතූන් (සමන්ත, 1900: 49) ද ශක්‍රයා වෙතින් දකුණු අකුධාතුව ද ලබාගෙන මෙරටට එම පූජා වස්තූන් හඳුන්වා දෙනු ලැබීය (සමන්ත, 1900: 49). එය මහින්දාගමනයෙන් පසු ඉදිකළ ප්‍රථම ථූපය වශයෙන් සලකන ථූපාරාමය ඉදිකිරීම (සමන්ත, 1900: 38) තුළින් තවදුරටත් පැහැදිලි වේ. මෙය පූර්වාදර්ශ කොටගෙන ශ්‍රී ලංකාවේ දකුණු, නැගෙනහිර, උතුර හා වෙනත් ප්‍රදේශයන් කරා (ධීරානන්ද හිමි, 2005:90) විශාල ස්තූපයන් ඉදිවීමේ සම්ප්‍රදායක් නිර්මාණය කිරීමට හැකි විය.

සංඝමිත්තාවන් විසින් ශ්‍රී මහාබෝධි ශාඛාවත් මෙහෙණි සසුනත් ගෙන ඒම (ථූපවංශ, 1959: පරි. 19, ගාථාව) මත අනුලා දේවිය සහ පිරිවර පැවිදි වීමෙන් මෙරට භික්ෂුණී ශාසනය ඇරඹුණු අතර ශ්‍රී ලංකාව හා ඉන්දියාව යන දෙරට සංස්කෘතික සබඳතාවය දැඩි කිරීමට ශ්‍රී මහාබෝධි ශාඛාව ද සම්බුද්ධ ධාතු හා පාත්‍රය ද ගෙන ඒම මත සිදුවනු ලැබීය. මෙතෙක් කාලයක් අවිධිමත් ඇදහිලි ක්‍රමවේදයක් භාවිත කළ ලාංකික ජනතාවට මහින්දාගමනයත් සමඟින් බුදුරජාණන් වහන්සේගේ ශාරීරික, පාරිභෝගික පූජා වස්තූන් හඳුන්වාදීම තුළ තිබුණු විශ්වාසයන්ට වඩා අර්ථාන්විත සංස්කෘතියක් (දීප,1970: පරි. 14, 5 - 18 ගාථා; ථූපවංශ, 1959: පරි. 16, 2-138 ගාථා; සමන්ත, 1900: 32 - 34) ලැබිණි.

මහින්දාගමනයත් සමඟින් මෙරට සාහිත්‍යාංගයන්හි වර්ධනයත් (සූරවීර, 1963: 32-34; මල්ලවාරච්චි, 1993: 35-46) ක්‍රි. පූ. 6 වැනි සියවස වැනි පැරණි කාලයට අයත් අක්ෂරයන් සම්බන්ධයෙන් පුරාවිද්‍යාත්මක තොරතුරු දක්නට හැකි වුවද අක්ෂර කලාවේ සීඝ්‍ර දියුණුවක් මෙන්ම රටපුරා බොහෝ සෙයින් ව්‍යාප්ත වීමක් (Deraniyagala, 1992: 741) ද දක්නට ලැබේ.

ලක්දිව තෙවැනි සියවසට පෙර ගෘහනිර්මාණ, වාස්තු විද්‍යාත්මක, කාර්මික, කැටයම් ආදී ක්ෂේත්‍රයන්හි වඩාත් දියුණුවක් ලබා තිබූ බවට විශ්වසනීය මූලාශ්‍ර මගින් තහවුරු නොවූව ද ස්තූපකරණය, වෙනත් කැටයම්, මූර්ති (සූරවීර, 1963: 63-72) ආදිය සම්බන්ධයෙන් ද මිහිඳු හිමියන් සහ සංඝමිත්තාවන් සමග ශ්‍රී ලංකාවට පැමිණි නොයෙක් පිරිස් තුළ කාර්මික, කෘෂිකාර්මික, වාස්තු විද්‍යාත්මක මෙන්ම විවිධ තාක්ෂණික පාර්ශ්වයන්හි තිබූ දැනුම මත මෙරට පෙරකී පාර්ශ්වයන්හි විශාල දියුණුවක් දක්නට ලැබේ (ථූපවංශ, 1959: පරි. 21, 1-2 ගාථා; සමන්ත, 1900: 44; සිරිවීර, 2004:19-

26). මිහිඳු හිමියන් විසින් ශ්‍රී ලංකාවට බුදුදහමත් සමඟ මහා සභ්‍යත්වයක් ගෙන ඒම (Rahula, 1966: 287) තුළින් ගොඩනැගුණු සංස්කෘතික පරිසරය මෙරට සංස්කෘතියෙහි අනන්‍යතාවය ඇති කිරීමෙහිලා ඍජුව බලපාන ලදි.

සංස්කෘතිකාංග ව්‍යාප්තියේ දී ප්‍රධාන සාධකයක් ලෙස වාණිජ කටයුතු මෙන්ම වාණිජ සබඳතාවයන්හි වර්ධනය ඉතාම වැදගත්ය. ඒ අනුව පුරාවිද්‍යාත්මක (Daraniyagala, 1990: 211-291) සාධකයන් හෙවත් නෂ්ඨාවශේෂයන් ශ්‍රී ලංකාවෙහි නොයෙකුත් ප්‍රදේශයන් තුළින් සොයාගත් පසු ශ්‍රී ලාංකිකයන් විසින් බොහෝ කාලපරිච්ඡේදයක සිටම විදේශයන් සමඟ එනම් ක්‍රි. පූ. 3 වැනි සියවසට පෙර සිටම වාගේ භාණ්ඩ හුවමාරු ක්‍රමයක් මෙන්ම යම්කිසි ආර්ථිකමය කටයුතු කරන්නට ඇතැයි සිතීමට ඉඩකඩ තිබේ (Siriweera, 1994: 125).

කෘෂිකර්මය හා වාණිජ අංශයන්හි කටයුතු දේශපාලන සංවිධානයෙහි වර්ධනය සඳහා බොහෝ සෙයින්ම බලපානු ලබන අතර එය සංස්කෘතිකාංග හුවමාරු වීමට මෙන්ම ව්‍යාප්ත වී මෙහිලා ද යහපත් පරිසරයක් ගොඩනගාලයි. ඈත අතීතයේ සිටම පෙර අපර දෙදිග වෙළඳුන් භාවිත කළ සුවිශේෂී වෙළඳ මධ්‍යස්ථානයක් ලෙසින් ශ්‍රී ලංකාව පැවැතිණි. මෙරට නාවික මාර්ගයක පිහිටීමත් නාවික කාර්යයන් සඳහා ඉතාම සුදුසු වරායන් රාශියක් තිබීමත් නිසා විශේෂයෙන් ඉන්දියාව හා අසල්වැසි රටවලින් වෙළඳුන් පැමිණියහ. ඒ අනුව ඊසාන දිග ඉන්දියාව, වයඹ දිග ඉන්දියාව, දකුණු දිග ඉන්දියාව හා ශ්‍රී ලංකාවේ ජම්බුකෝළ, ගෝකණ්ණ හා මහාතිත්ථ යනාදී වරායන් (ලියනගමගේ සහ ගුණවර්ධන, 1987: 46.-48) භාවිත කරමින් එකල විශාල ඉල්ලුමක් ලෝකය පුරා තිබුණු මුතු, මැණික්, ඇත් දත් අපේක්ෂාවෙන් ශ්‍රී ලංකාවට වෙළඳුන් පැමිණියහ. මෙරට මුතු, මැණික් (Kiribamune, 1991-1992: 180) වාණිජ භාණ්ඩ අතර සුවිශේෂය. විදේශ මැටි බඳුන් සහ අශ්වයන් ගැන සඳහන් තොරතුරුවලින් පෙනීයන්නේ විදේශ රටවල් සමඟ සබඳතා පවත්වාගෙන ගිය බවකි (Deraniyagala, 1972: 140-142).

ක්‍රි. පූ. 3 වැනි සියවසේ දී ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ අශෝක රජු හා තිස්ස යන දෙදෙනා ගොඩනගා ගනු ලැබූ සබඳතාවයෙහි ආර්ථිකමය අදහස් ඇති ද යන්න සළකා බැලීම වැදගත්ය. දීපවංශය, මහාවංසය සහ සමන්තපාසාදිකාවිනයට්ඨකථාව ආදී මූලාශ්‍රයන්හි එන තොරතුරු අනුව ආර්ථිකය සඳහා සුවිශේෂි වැදගත් තැනක් ඇතැයි සිතිය හැක. විනයට්ඨකථාව සහ වංසකථා දී මූලාශ්‍රවලට අනුව දෙවනපෑතිස්ගේ පුණ්‍ය මහිමය නිසා රාජ්‍යයෙහි නොයෙක් ස්ථානයන්හි නොයෙක් වටිනා දෑ පහළ වූ බව සඳහන් වේ. ඒ අනුව මුහුදෙන් මුතු මැණික් සහ නොයෙකුත් වර්ගයෙහි රත්නයන් පහල වූ බව පෙනේ (දීප, 1970: පරි. 19 - 20; ථූපම, 1959: පරි. 11, 14-16 ගාථා; සමන්ත, 1900: 25 - 29). ඒවා ලබාගත් රජු අශෝකයන් වෙත යැවූ බවත් සඳහන් වේ. එම බණිජ ද්‍රව්‍යන්ගේ පහළවීම කෙසේවුවද ලක්දිව මෙම සම්පත් තිබූ බව පැහැදිලිය. ආර්ථිකමය පාර්ශ්වයෙන් වැදගත්කමක් දරන මුතු, මැණික් ආදී සම්පත් මෙරට තිබෙන හෙයින් දෙරට අතර සබඳතාවක් ගොඩනගාගන්නට උත්සාහ දරන්නට ඇත. එසේම ශ්‍රී ලංකාව මේ කාලය වනවිටත් ඊට පෙර සිටම වැදගත් වාණිජ මධ්‍යස්ථානයක් වශයෙන් හුවමාරු වන ස්ථානයක් වන හෙයින් පෙර අපර දෙදිගම ජනයාට අවශ්‍ය වෙනත් භාණ්ඩයන් ද ශ්‍රී ලංකාවෙහි වූ හෙයින් එහි වටිනාකම තේරුම්ගත් අශෝක රජු ඒ අනුව ක්‍රියාකරන්න ඇත.

පුරාවිද්‍යාත්මක සාක්ෂිවලට අනුව ක්‍රි. පූ. 3 වැනි සියවස වනවිට ශ්‍රී ලංකාව කෘෂිකාර්මික හා තාක්ෂණික පාර්ශ්වයන්ගෙන් ඉදිරියට එමින් තිබූ සමාජයක් විය (ධීරානන්ද හිමි, 2005: 85). සමාජ, ආර්ථික යන අංශයන්හි සිදු වූ වෙනස්වීම් හා එහි බලපෑම සමාජය තුළ නායකත්ව ඇතිවීමට වගේම එම නායකත්වය මුල්කරගනු ලැබූ පාලන ඒකක බිහිවීම (ධීරානන්ද හිමි, 2004: 244) කෙරෙහිත් පදනම් වූයේය.

ක්‍රි. පූ. තෙවැනි සියවස වන විට වාණිජ වශයෙන් වැදගත් වූ මුතු, මැණික්, ඇත්දත් ආදී වාණිජ භාණ්ඩ ලබාගත හැකි රටක් සමග සමීප සම්බන්ධතා පවත්නා ගැනීම මෞර්යනට ද ප්‍රයෝජනවත් වන්නට ඇති බැවින් තවදුරටත් මේ සම්බන්ධය තහවුරු කරගැනීමට සංස්කෘතික පාර්ශ්වය තුළින් අශෝකයන් උනන්දු වන්නට ඇතැයි අනුමාන කිරීමට පුළුවන. ඒ අනුව මෙම සබඳතාවයන්හි යම්කිසි අයුරකින් ආර්ථිකමය පාර්ශ්වීය අභිලාෂයන් ද තිබූ බව පෙනීයන අතර එය සංස්කෘතික අංශයන්හි සංවර්ධනයට බලපාන ලදි.

## සමාලෝචනය

මහින්දාගමනය ශ්‍රී ලාංකේය ඉතිහාසයෙහි ඉතාමත් වැදගත් සංදිස්ථානයක් වශයෙන් සැලකිය හැකි බව අවිවාදිතය. එහෙයින්ම, එය මෙරට සංස්කෘතියෙහි සමාරම්භය වශයෙන් ද ඇතැම්හු සලකති. එමඟින් බුදුදහම මෙන්ම මෙරටට නව සංස්කෘතියක් ද ලැබිණි. එතුළින් ලක්දිව ලැබූ විශිෂ්ට දායාදයන් වන්නේ වෙහෙර විහාර ඉදිකරවීම, ශ්‍රී මහාබෝධිය රෝපණය කිරීම, කලාව හා ගෘහනිර්මාණ ශිල්පය ඇතිකරවීම, සාහිත්‍ය අංශයේ ප්‍රබෝධය ආදිය පෙන්වා දිය හැකිය. මහින්ද මහා තෙරුන් වහන්සේ ත්‍රිපිටකය හා අට්ඨකථා ලක්දිවට රැගෙනවිත් මෙරට වාසීන්ගේ ධර්මාවබෝධය සඳහා සිංහල භාෂාවට පරිවර්තනය කළ බවත් පැහැදිලිය. ඒ අනුව මහින්දාගමනය යනු සිංහල සංස්කෘතියේත් ශ්‍රී ලාංකේය බුද්ධ ශාසනයේත් සමාරම්භක දිනය වශයෙන් බොහෝමයක් දෙනා සලකති. මෙරට ඉතිහාසයෙහි සන්ධිස්ථානයක් වශයෙන් සැලකෙන මහින්දාගමනයේත් ඒ සඳහා පසුබිම සැකසුණු මෞර්ය පාලක අශෝක අධිරාජ්‍යයාගේ ඓතිහාසිකත්වය පුරාවිද්‍යාත්මක සාක්ෂි තුළින් සනාථ වීම ඉතාමත් වැදගත් වෙනවා මෙන්ම එහි නිරවද්‍යතාව පැහැදිලිවම සනාථ කරගැනීමටත් හැකි වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

ඌනපූරණ සහිතො මහාවංසො, (1959). සංස්. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

දීපවංශය, (1970). සංස්. කිරිඇල්ලේ ඥාණවිමල හිමි, කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

වංසත්ථප්පකාසිනිය, මහාවංශ ටීකාව, (1994). සිංහල අනුවාදය, අකුරැටියේ අමරවංස හිමි සහ හේමචන්ද්‍ර දිසානායක, කැළණිය: කැළණිය විශ්ව විද්‍යාලය.

සමන්තපාසාදිකාව, (1990). සංස්. සයිමන් හේවාවිතාරන, කොළඹ: ත්‍රිපිටක ප්‍රකාශන මුද්‍රණාලය.

එල්ලාවල, එච්. (1968). පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය, කොළඹ: ලංකාණ්ඩුවේ මුද්‍රණාලය.

ගයිගර්, විල්හෙල්ම් (1969). මධ්‍යකාලීන යුගයේ ලංකාවේ සංස්කෘතිය, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

ධීරානන්ද හිමි, හඟුරන්කෙත (2004). රාජත්වය, රාජ්‍යය සහ ආගම, වරකාපොලඃ ආරිය ප්‍රකාශකයෝ.

මල්ලවාරච්චි, උදය (1993). මිහිඳු සංස්කෘතිය හා මිහින්තලේ, කොළඹ, ප්‍රදීප ප්‍රකාශකයෝ.

හෙට්ටිආරච්චි, ඇස්. බී. (2008). ලංකාවේ සමාජ හා සංස්කෘතික ඉතිහාසය, මහරගමඃ තරංජී ප්‍රින්ට්ස්.

Corpus Inscripationum Indicarum, (1925). Vol. I, ed. E.Hultzch; London: Oxford University Press.

Codrington, H.W. (1947). A short History of Ceylon, London: Macmillan & Company.

Deraniyagala, S.U. (1992). The Pre History of Sri Lanka an Ecological Perspective, Colombo: Archaeological Survey Department of Sri Lanka.

Mookerji, R. (1928). ASOKA, London: Macmillan and Limited.

Pakeman, S.A. (1964). Ceylon, London: Erness. Benn.

Siriweera,W.I. (1994). “Pre-colonial Sri Lanka's maritime commerce with special references to its ports”, Sri Lanka and the silk Road of the Sea, ed. Senanayake,et.al; Colombo: Karunarathne & Sons.